ඩුබායි සිට පැමිණි ගුවන් යානයකදී හඳුනාගත් අයෙකුට කාන්තාවක් සිය දෙහැවිදිරි දරුවෙකු බලාගැනීමට යැයි දී පලා යෑම පිළිබඳ පුවතක්, පසුගිය සතියේ මාධ්‍ය ඔස්සේ ආවරණය වී තිබූ අතර, එහිදී තෝරාගත් සිංහල භාෂා පුවත් සිරස්තල කිහිපයක් ඔස්සේ එම සිදුවීම පිළිබඳව දැක්වී තිබූ ආකාරය අපි ඉදිරිපත් කළෙමු.

මෙම සතියේදීද, සති අග අරුණ පුවත්පත (සැප්.04, 2022) එම සිදුවීම පිළිබඳව විස්තරාත්මක ලිපියක් පළ කර තිබේ. එම ලිපියේ අන්තර්ගතය තුළ එම කාන්තාව පොලීසියට කළ පාපොච්චාරණය ඔස්සේ, එම කාන්තාවට විදේශයේදී විඳීමට සිදුවූ ගැහැටත්, ඇගේ අනපේක්ෂිත ගැබ්ගැනීමත්, එය ලංකාවේ සිය පවුලේ අයවලුන් දැනගැනීමෙන් වැළැක්වීමට ඇය මෙසේ ක්‍රියා කිරීමත් සම්බන්ධයෙන් සඳහන්ව තිබේ. කෙසේ වෙතත්, සති අග අරුණ ලිපිය මගින්ද මෙම පුවත ඉදිරිපත් කර තිබුණේ, "සෞදියෙන් කටුනායකට ආ මෝහිනී" යන සිරස්තලය සමඟිනි. නමුත්, පුවත් අන්තර්ගතය තුළ කිසිම තැනක අදාළ කාන්තාව හැඳින්වීම සඳහා එවැනි හැඳින්වීමක් භාවිතා වී නොතිබුණි.

එසේ නම් ඔබ සිතන ලෙසට,

1) මෙහිදී කාන්තාවට මුහුණ දීමට සිදුව ඇති සිදුවීම් දෙස ඇගේ පාර්ශවයෙන් සිතා බලන විට, ඇය "මෝහිනී" ලෙසින් සිරස්තලය තුළ හැඳින්වීම කෙතරම් සංවේදී ද?

2) පුවත් සිරස්තල යෙදීමේදී නිර්මාණශීලී වීමට මාධ්‍යවේදීන්ට ඇති අයිතිය අවිවාදාත්මක වේ. එසේම බොහෝ විට පුවතකට හෝ ලිපියට සිරස්තල යොදන්නේ එය ලියූ මාධ්‍යවේදියා නොව පුවත්පත් කර්තෘවරයෙකු බවද, මේ පිළිබඳව මින් පෙර අදහස් දක්වා ඇති මාධ්‍යවේදීන් පෙන්වා දෙන කරුණකි. එසේ වුවත්, මෙවැනි සිරස්තල යෙදීමේදී පුවතට අදාළ සියලු පාර්ශවයන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් සංවේදී භාවයක් තිබිය නොවන්නේ ද?

මින් පෙර මේ පිළිබඳව අප පළ කළ පෝස්ටුවට
සබැඳිය: **https://www.facebook.com/ethicseye/photos/1752193728469010**